**ඔසාකා ප්‍රාන්ත අධ්‍යාපන මණ්ඩලය**

**ආපසු පැමිණෙන්නන් සහ විදේශීය සිසුන් සඳහා අධ්‍යාපන උපකාරක වැඩසටහන**

**2024 සංස්කරණය**

# ඔබ තෝරාගන්නා වෘත්තිය ඔබේ අනාගතයයි

**ඔසාකා ප්‍රාන්ත අධ්‍යාපන මණ්ඩලය**

＜シンハラ語＞

# අන්තර්ගතය

■ පෙරවදන········ පිටු අංක 1

■ ජපානයේ අධ්‍යාපනික ව්‍යුහය········ පිටු අංක 2

■ උසස් පාසල් වර්ග········ පිටු අංක 3

■ උසස් පාසලේ සාමාන්‍ය දවසක්········ පිටු අංක 7

■ උසස් පාසලේ සාමාන්‍ය වසරක්········ පිටු අංක 8

■ පාසල් ගාස්තු········ පිටු අංක 9

■ ප්‍රවේශ විභාගය········ පිටු අංක 10

■ රජයේ උසස් පාසල්

ප්‍රවේශ විභාගයෙන් ආවරණය වන විෂයයන්········ පිටු අංක 12

ප්‍රවේශ නිර්ණායක········ පිටු අංක 14

ආපසු පැමිණෙන සිසුන් සඳහා ප්‍රවේශ විභාගය········ පිටු අංක 15

ජපන් භාෂා සහය අවශ්‍ය විදේශීය සිසුන් සහ ආපසු පැමිණෙන සිසුන් සඳහා ප්‍රවේශ විභාගය········ පිටු අංක 16

ජපන් භාෂා සහය අවශ්‍ය අනෙකුත් සිසුන් සහ ආපසු පැමිණෙන සිසුන් සඳහා විශේෂ අවකාශ········ පිටු අංක 17

ප්‍රවේශ විභාග කාලසටහන········ පිටු අංක 19

■ පාසල් ගාස්තු සඳහා මූල්‍ය සහය

උසස් පාසල් ප්‍රවේශය සඳහා මූල්‍ය සහය සපයන සංවිධාන ········පිටු අංක 21

ශිෂ්‍යත්ව ක්‍රමය········ පිටු අංක 22

■ උසස් පාසල සඳහා විකල්ප········ පිටු අංක 24

■ උපකාරක සංවිධාන ලැයිස්තුව········ පිටු අංක 25

# පෙරවදන


ඔසාකා ප්‍රාන්තයේ උසස් පාසලකට ඇතුළත් වීමට බලාපොරොත්තු වන සිසුන් සඳහා මෙම පොත් පිංච නිර්මාණය කර ඇත. උසස් පාසලක් යනු කුමක්ද ගැළපෙන පාසලක් තෝරා ගන්නේ කෙසේද යනාදිය පිළිබඳ මූලික තොරතුරු මෙහි අඩංගු වේ. අනාගත අධ්‍යාපන මාවතක් තෝරා ගැනීමට මෙන්ම විමසීමට ඇති ඕනෑම ප්‍රශ්නයකට පිළිතුරු සැපයීමට හැකි ක්‍රමවේදයක් ඔසාකා ප්‍රාන්තයේ ඇත. උසස් පාසල වෙත ප්‍රවේශවීම හෝ සහභාගීවීම පිළිබඳ කිසියම් ප්‍රශ්නයක් හෝ සැකයක් ඇත්නම්, කරුණාකර ඔබේ පන්ති භාර ගුරුවරයා හෝ මෙම පොත් පිංචේ හඳුන්වා දී ඇති ආයතනවලින් විමසන්න.

※ මෙම පොත් පිංච ඔසාකා ප්‍රාන්ත අධ්‍යාපන නියෝජිතායතනයේ වෙබ් අඩවියෙහි ප්‍රාථමික, කනිෂ්ඨ සහ උසස් පාසල් අංශය සඳහා වූ වෙබ් පිටුවේ ඇත.

මෙය ජපන්, චීන, කොරියානු, වියට්නාම, පිලිපීන, පෘතුගීසි, ස්පාඤ්ඤ, තායි, ඉංග්‍රීසි, ඉන්දුනීසියානු, රුසියානු, නේපාල, උර්දු, අරාබි, මැලේ සහ යුක්රේන භාෂාවෙන් ලබා ගත හැකිය.

(https://www.pref.osaka.lg.jp/o180080/shochugakko/kikokutoniti-sapo/shinro-senntaku.html)

■ මෙම පොත් පිංචෙහි භාවිත කර ඇති සංකේත ත්‍රිත්වයේ අර්ථය


මෙම සංකේතය යටතේ එක් එක් මාතෘකාවෙහි ප්‍රධාන කරුණු පැහැදිලි කරයි.

අවධානය යොමු කිරීමට අවශ්‍ය විය හැකි සවිස්තරාත්මක තොරතුරු මෙය තුළ අන්තර්ගත වේ.


මෙම සංකේතය යටතේ නිරතුරු අසන ප්‍රශ්න සහ පිළිතුරු දක්වන අතර පොත් පිංචෙහි අදාළ මාතෘකා වෙත ඔබේ අවධානය යොමු කරනු ඇත.

# ජපානයේ අධ්‍යාපනික ව්‍යුහය

**ජපානයේ ළමුන් වයස අනුව ප්‍රාථමික/මූලික හෝ කනිෂ්ඨ උසස්/මධ්‍යම පාසලකට සහභාගී වීම අනිවාර්ය වේ. මෙම කාලසීමාව අවසන් වීමෙන් පසු වැඩිදුර අධ්‍යාපනය ලබාගැනීමට හෝ වෙනත් විකල්ප මාර්ගයකට අවතීර්ණ විය හැකිය.**

අනිවාර්ය අධ්‍යාපනය (වයස 7 – වයස 15)

- වයස 7 – වයස 12: ප්‍රාථමික/මූලික පාසල — අවුරුදු 6යි
- වයස 13 – වයස 15: කනිෂ්ට උසස්/මැදි විද්‍යාලය — අවුරුදු 3යි

වයස 16 – වයස 18:

- උසස් පාසල — අවුරුදු 3යි
- විශේෂ පුහුණු පාසල — අවුරුදු 1 හෝ 1ට වැඩි
- කාර්මික විද්‍යාලය — අවුරුදු 5යි
- වෘත්තිය පුහුණු පාසල — අවුරුදු 1ක් හෝ 2ක්

වයස 19 – වයස 22:

- විශ්ව විද්‍යාලය — අවුරුදු 4-6
- කනිෂ්ට පාසල — අවුරුදු 2යි
- තාක්ෂණික විද්‍යාලය — අවුරුදු 1 හෝ 1ට වැඩි


වයස 23 – වයස 24:

- උපාධි පාසල — අවුරුදු 2-5

සියලුම උසස් පාසල් පාඨමාලා වසර 3ක් දීර්ඝ වේ ද?

⇒ පූර්ණ කාලීන පාඨමාලාවක් සඳහා අධ්‍යයන කාලය සාමාන්‍යයෙන් වසර 3කි. වෙනත් පාඨමාලා සඳහා කරුණාකර 5 සහ 6 පිටුව බලන්න.

# උසස් පාසල් වර්ග



**ජපානයේ රජයේ උසස් පාසල්, ජාතික උසස් පාසල් සහ පෞද්ගලික උසස් පාසල් තිබේ.**

■ **රජයේ උසස් පාසල (ජාතික උසස් පාසල් ඇතුළුව):**

－ ජාතික, ප්‍රාන්ත හෝ නාගරික අරමුදල් රජය විසින් සපයනු ලැබේ


－ මිශ්‍ර පාසල් අධ්‍යාපනය ලබා දේ

■ **පෞද්ගලික උසස් පාසල:**

－ පුද්ගලයන් හෝ සමාගම් විසින් ආරම්භ කරන ලදී. බොහෝ අවස්ථාවන්හිදී ජාතික සහ රජයේ උසස් පාසල්වලට සාපේක්ෂව පාසල් ගාස්තු ඉහළ වේ. ※

－ මිශ්‍ර පාසල්වලට අමතරව පිරිමි සහ බාලිකා පාසල් ද තිබේ.

※ එක් එක් ගෘහයේ ආදායම අනුව පෞද්ගලික උසස් පාසල් ගාස්තු සඳහා සහය වීමට ක්‍රමයක් ඇත.
⇒ කරුණාකර පිටු අංක 9 බලන්න.



රජයේ උසස් පාසල් සහ පෞද්ගලික උසස් පාසල් ප්‍රවේශ විභාග සමානද?

⇒ නැත. රජයේ සහ පෞද්ගලික උසස් පාසල් අතර ප්‍රවේශ නිර්ණායක සහ ක්‍රියා පටිපාටි වෙනස් වේ.

■ රජයේ උසස් පාසල් ප්‍රවේශ විභාග මගින් ආවරණය වන විෂයයන්

⇒ කරුණාකර පිටු අංක 12 සහ 13 බලන්න.

■ පෞද්ගලික උසස් පාසල් ප්‍රවේශ විභාග

කාලසටහන්, අන්තර්ගතය සහ ප්‍රවේශ නිර්ණායක පාසල අනුව වෙනස් වේ. වැඩිදුර තොරතුරු සඳහා, ඔබේ කනිෂ්ඨ උසස් පාසලේ ප්‍රවේශ විභාග භාර ගුරුවරයාගෙන් විමසිය යුතුවේ.

**ඔසාකාහි උසස් පාසල් වර්ග හතරක් වේ. එක් එක් පාසලේ විවිධ කාල පරිච්ඡේද, පාඨමාලා කාලසීමාවන් සහ පන්ති වර්ග තිබේ.**

**<පූර්ණ කාලීන උසස් පාසල්>**

**■ පාසලේ කාල සීමාව**

උදේ සිට සවස දක්වා (සාමාන්‍යයෙන් පෙ.ව. 8:30 සිට ප.ව. 5:00 දක්වා)

**■ පාඨමාලා කාලය වසර 3 කි**

**■ පන්ති** වර්ග

දිවා කාලයේ පන්ති පවත්වන බොහෝ පාසල්වල සිසුන්ට නියමිත පාඨමාලා ඒකක සංඛ්‍යාවකට සහභාගී වීමට සිදුවේ. ඊළඟ අධ්‍යයන වර්ෂයේ ඉහළ ශ්‍රේණියට සමත්වීම සඳහා එම පාඨමාලා ඒකක සම්පූර්ණ කර, නියමිත අධ්‍යයන සම්භාර (ක්‍රෙඩිට්) ප්‍රමාණය ලබාගැනීම අවශ්‍ය වේ. අධ්‍යයන සම්භාර පද්ධති මොඩියුලයක් සහිත පාසල්වල සිසුන්ට තමන්ගේ පාඨමාලා ඒකක අභිමත පරිදි තෝරාගත හැක.

**■ පූර්ණ කාලීන උසස් පාසල් සඳහා උදාහරණ**

**[සාමාන්‍ය අධ්‍යයන පාඨමාලාවක් සහිත උසස් පාසල්]**

සියලුම සිසුන් ජපන් භාෂාව සහ ගණිතය වැනි පොදු විෂයයන් ඉගෙනගනී.

**[විශේෂිත පාඨමාලා සහිත උසස් පාසල්]**

කර්මාන්ත, වාණිජ, කෘෂිකර්ම, හෝ අන්තර් සංස්කෘතික අධ්‍යයන වැනි විශේෂිත ක්ෂේත්‍රයන්හි මූලික දැනුම ලබා ගනී. ඊට අමතරව, සිසුන් සහතික ලබා ගැනීමේ හැකියාව වැඩි දියුණු කෙරෙන කුසලතා ලබා ගනී.

**[ඒකාබද්ධ අධ්‍යයන පාඨමාලාවක් සහිත උසස් පාසල්]**

පොදු විෂයයන්ට අමතරව, සිසුන්ගේ රුචිකත්වය අනුව තෝරාගතහැකි බොහෝ විකල්ප විෂයයන් පිරිනමනු ලැබේ.

**[බලගැන්වීමේ පාසල්]**

සිසුන්ට ඔවුන්ගේ මට්ටම අනුව මූලික කරුණු නැවත ඉගෙනගත හැකි අතර තනි නිවැරදි පිළිතුරක් නොමැති ගැටළු විසඳාගත හැක. විවේචනාත්මකව සිතීමේ හැකියාව වැඩිදියුණු කළ හැකිය.

**[අනු පාසල්] / [ස්ටෙප් ස්කූල්]**

එක් පන්තියකට සිසුන් 30ක් පමණ සිටින සූක්ෂම ආධාරක පද්ධති සහිත පාසල් වේ. පොදු විෂයයන්ට අමතරව, පාසලේ ප්‍රාදේශීය කලාපයේ සුවිශේෂී ලක්ෂණ උපරිම ලෙස භාවිත කරන අත්දැකීම් සහිත ඉගැන්වීමේ ක්‍රම භාවිතයෙන් පන්ති පවත්වනු ලැබේ.

<බහු අධ්‍යයන සම්භාර පද්ධති සහිත උසස් පාසල් ("නිර්මාණාත්මක පාසල්")>

■ පාසලේ කාල සීමාව

1 වන සැසිය = උදෑසන (සාමාන්‍යයෙන් පෙ.ව. 8:30 සිට ප.ව. 12:30 දක්වා)

2 වන සැසිය = දහවල් (සාමාන්‍යයෙන් ප.ව. 1:00 සිට ප.ව. 5:00 දක්වා)

■ පාඨමාලා කාලය

ශිෂ්‍යයෙකු පළමු සහ දෙවන සැසි සඳහා සහභාගී වන්නේ නම් = අවුරුදු 3+

ශිෂ්‍යයෙකු පළමු සහ දෙවන සැසි සඳහා වෙන වෙනම සහභාගී වන්නේ නම් = අවුරුදු 4+

■ පන්ති වර්ග

සිසුන්ට ඔවුන්ගේ ජීවන රටාවට සහ වේගයට ගැලපෙන පරිදි විෂයයන් සහ පන්ති වේලාවන් තෝරා ගත හැකිය. 1 වන හෝ 2 වන සැසිවල පන්ති තිබේ. කාලපරිච්ඡේදයක් සම්පූර්ණ වසරක සිට අර්ධ වසරක කාල පරාසයක් දක්වා වෙනස් විය හැක.

<දිවාකාල සහ සන්ධ්‍යා අධ්‍යයන සම්භාර පද්ධති පිරිනමන උසස් පාසල්>

■ පාසලේ කාල සීමාව

සිසුන් 1 වන කාලපරිච්ඡේදයේ සිට 10 වන කාලපරිච්ඡේදය (පෙ.ව. 10:50 සිට ප.ව. 9:05 දක්වා) තමන් කැමති කාල පරිච්ඡේද තෝරා ගනී.

උදාහරණ වශයෙන්,

බොහෝ විට දිවා පන්ති පෙ.ව.10:50 සිට ප.ව. 4:30 දක්වා

බොහෝ විට සවස පන්ති ප.ව. 5:35 සිට ප.ව. 9:05 දක්වා

■ පාඨමාලා කාලය

දිවා කාලයේ පන්ති නම් අවුරුදු 3යි. සවස පන්ති නම් බොහෝ විට අවුරුදු 4 යි.

ඇතැම් දිවා-පාඨමාලා විෂයය ඒකක සමඟ ඒකාබද්ධ නම්, අවුරුදු 3යි.

■ පන්ති වර්ග

සිසුන්ට ඔවුන්ගේ ජීවන රටාවට සහ වේගයට ගැලපෙන පරිදි විෂයයන් සහ පන්ති වේලාවන් තෝරා ගත හැකිය.

1 වන වසර සිසුන් සඳහා නිශ්චිත පන්ති කාලසටහනක් ඇති අතර ඔවුන් ප්‍රධාන වශයෙන් අනිවාර්ය විෂයයන් අධ්‍යයනය කරයි.

2 වන වසරේ සිට සිසුන් තම වෘත්තීය අභිලාෂ සහ රුචිකත්වය අනුව විෂයයන් තෝරා ගනී.

**< සන්ධ්‍යා අර්ධ කාලීන පාඨමාලා පිරිනමන උසස් පාසල්>**

**■ පාසලේ කාල සීමාව**

බොහෝ පාසල්වල ප.ව. 6:00 සිට ප.ව. 9:00 දක්වා පන්ති තිබේ.

**■ පාඨමාලා කාලය**

අවුරුදු 4 යි

දුරස්ථ අධ්‍යයන පාඨමාලාවක් සමඟ ඒකාබද්ධව ගතහොත් වසර 3ක් හෝ ඊට වැඩි කාලයක් ගත වේ.

**■ පන්ති වර්ග**

සවස පන්ති පවත්වනු ලැබේ. එක් එක් පන්තිය සඳහා අධ්‍යයන සම්භාර ලබා දෙනු ලැබේ.

< දුරස්ථ අධ්‍යයන පාඨමාලා පිරිනමන උසස් පාසල් >

■ පාසලේ කාල සීමාව

පන්ති පැමිණීමේ අවශ්‍යතා පාසලෙන් පාසලට වෙනස් නමුත් සාමාන්‍යයෙන් සතියකට දින 2-3ක් වේ. පන්තිවලට සහභාගි වන දින සහ වාර ගණන පාසල අනුව වෙනස් වේ.

**■ පාඨමාලා කාලය**

අවුරුදු 3ක් හෝ ඊට වැඩි

**■ පන්ති වර්ග**

පන්ති නොමැති දිනයන්හි, සිසුන් සටහන් සහ පෙළපොත් මගින් ස්වයං අධ්‍යයනයෙන් ඉගෙන ගන්නා අතර වාර්තා ඉදිරිපත් කිරීමෙන් පසු මාර්ගෝපදේශන ලබා ගනී.

අධ්‍යයන සම්භාර යනු මොනවාද?

⇒ උසස් පාසලේ යම් පාඨමාලාවක් හැදෑරීමට ගත කරන කාලය දැක්වීමට "අධ්‍යයන සම්භාර" යන වචනය භාවිත වේ. අවශ්‍ය ඉගෙනුම් ප්‍රතිඵල අත්කරගෙන ඇති විට, එම විෂයය සඳහා " අධ්‍යයන සම්භාර " ප්‍රදානය කෙරේ.

එක් අධ්‍යයන සම්භාරයක් අධ්‍යයන පාඨමාලා ඒකක 35ක් වන අතර, එක් ඒකකයක් විනාඩි 50කි.

(මිනිත්තු 50 × අධ්‍යයන පාඨමාලා ඒකක 35 = විනාඩි 1750)

සිසුන් නිශ්චිත අධ්‍යයන පාඨමාලා ඒකක සංඛ්‍යාවක් සම්පූර්ණ කර අවශ්‍ය අධ්‍යයන සම්භාර සංඛ්‍යාව ලබා ගැනීමෙන් පසු උපාධිය ලබා ගනී.

# උසස් පාසලේ සාමාන්‍ය  දවසක්

**පූර්ණ කාලීන උසස් පාසලක එදිනෙදා ශිෂ්‍ය ක්‍රියාකාරකම් සඳහා උදාහරණ පහත දැක්වේ.**

■ **උදෑසන**

පාසල සාමාන්‍යයෙන් පෙ.ව. 8:30 ට ආරම්භ වන අතර උදෑසන කාලපරිච්ඡේද හතරක් ඇත. එක් එක් විෂයය සඳහා වෙන් වූ ගුරුවරුන් සිටී.

■ **දිවා ආහාරය**

පාසල් දිවා ආහාරය ලබා නොදේ. සිසුන්ට නිවසින් දිවා ආහාරය ගෙන ඒමට හෝ පාසල් ආපනශාලාවක් තිබේ නම් එහිදී මුදල් ගෙවා ආහාර ගැනීමට හැකිය.

■ **දහවල්**

සවස් කාලයේ කාලපරිච්ඡේද 2ක් හෝ 3ක් තිබේ.

■ **පාසලෙන් පසු**

උනන්දුවක් දක්වන අය සඳහා සහභාගී වීමට ක්‍රීඩා හෝ සංස්කෘතික සමාජ වැනි විෂය බාහිර ක්‍රියාකාරකම් ඇත. සහභාගීත්වය ස්වේච්ඡාවෙන් සිදු වේ.

පාසලට ඇඳිය යුතු ඇඳුම් මොනවාද?

⇒ ඔසාකා ප්‍රාන්තයේ රජයේ ද්විතීයික පාසල්වල පාසල් නිල ඇඳුම් "සෙයිෆුකු" හෝ "හොාජුන්-ෆුකු" ලෙස හඳුන්වනු ලබන අතර ගිම්හාන සහ ශීත කාලයට විශේෂිත නිල ඇඳුම් ඇත.

කෙසේ වෙතත්, ඇතැම් උසස් පාසල්වල සිසුන්ට නිශ්චිත පාසල් නිල ඇඳුමක් ඇඳීමට අවශ්‍ය නොවේ,

# උසස් පාසලේ සාමාන්‍ය වසරක්

**පාසල් අධ්‍යයන වාර තුනකින් හෝ දෙකකින් සමන්විත අධ්‍යයන වර්ෂයක් ඇති පූර්ණ කාලීන උසස් පාසලක සාමාන්‍ය පාසල් වර්ෂයක් පහත දැක්වේ. (දෙවන වාරය සඳහා ආරම්භක දිනය පාසල අනුව වෙනස් වේ).**

**ජපන් පාසල් වර්ෂය අප්‍රේල් මාසයේ ආරම්භ වන අතර ඊළඟ වර්ෂයේ මාර්තු මාසයේදී අවසන් වේ.**

**■ 1 වන වාරය (සාමාන්‍යයෙන් අප්‍රේල් සිට ජූලි දක්වා)**

ප්‍රවේශ උත්සවය, සමාරම්භක උත්සවය, සෞඛ්‍ය පරීක්ෂාව, ශාරීරික යෝග්‍යතා පරීක්ෂණය

ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකාව, වාර අවසාන පරීක්ෂණ

දෙමාපිය-ගුරු-ශිෂ්‍ය හමුව

සමාප්ති උත්සවය

**■ ගිම්හාන නිවාඩුව (සාමාන්‍යයෙන් ජූලි අග සිට අගෝස්තු අග දක්වා)**

**■ 2 වන වාරය (සාමාන්‍යයෙන් අගෝස්තු අග සිට දෙසැම්බර් දක්වා)**

සමාරම්භක උත්සවය

මලල ක්‍රීඩා උළෙල (සමහර පාසල්වල පළමු වාරයේ දී පැවැත්වේ)

පාසල් සංස්කෘතික උත්සවය / අධ්‍යයන ජයග්‍රහණ ඉදිරිපත් කිරීම

පාසල් චාරිකාව (මූලික වශයෙන් දෙවන වසරේ සිසුන් සඳහා සංවිධානය කර ඇත)

වාර අවසාන පරීක්ෂණ

දෙමාපිය-ගුරු-ශිෂ්‍ය හමුව

සමාප්ති උත්සවය

**■ ශීත නිවාඩුව (සාමාන්‍යයෙන් දෙසැම්බර් අග සිට ජනවාරි මුල දක්වා)**

**■ 3 වන වාරය (සාමාන්‍යයෙන් ජනවාරි මුල සිට මාර්තු දක්වා)**

සමාරම්භක උත්සවය

වාර අවසාන පරීක්ෂණ

දෙමාපිය-ගුරු-ශිෂ්‍ය හමුව

උපාධි ප්‍රදානෝත්සවය, වාර අවසාන උත්සවය

**■වසන්ත නිවාඩුව (මාර්තු අග සිට අප්‍රේල් මුල දක්වා)**

# පාසල් ගාස්තු

**පාසලේ ඉගෙනීමට පාසල් ගාස්තු ගෙවීම අවශ්‍ය වේ. ගාස්තුව පාසල සහ පාඨමාලා වර්ගය අනුව වෙනස් වේ, එනම් පුද්ගලික හෝ පොදු, අර්ධ-කාලීන සවස පන්ති, දුරස්ථ අධ්‍යයන පාඨමාලා ආදිය.**

## ■ අවශ්‍ය පාසල් ගාස්තු සහ අදාළ වියදම්

① විභාග ගාස්තු = ප්‍රවේශ විභාගය සඳහා ගාස්තු

② ප්‍රවේශ ගාස්තුව = ඇතුළත් වීමේ ගාස්තුව

③ පාසල් ගාස්තු = පන්ති ගාස්තු

④ පළමු පාසල් අධ්‍යයන වර්ෂය සඳහා වන පිරිවැය යනු 1 , 2 , සහ 3 බාණ්ඩයන්හි ගාස්තු සහ පෙළපොත් ගාස්තු එකතුව වේ. ඊට අමතරව පාසල් නිල ඇඳුම් ගාස්තු අවශ්‍ය පාසල්වලට ගෙවිය යුතුය.

| | | ① විභාග ගාස්තු | ② ඇතුළත්වීමේ ගාස්තු | ③ පාසල් ගාස්තු | ④ පළමු වසර සඳාහා සම්පූර්ණ ගාස්තුව |
|---|---|---|---|---|---|
| පූර්ණ-කාලීන | රජයේ උසස් පාසල: | යෙන් 2,200 | යෙන් 5,650 | යෙන් 118,800 | යෙන් 300,000ක් පමණ |
| | පෞද්ගලික පාසල ※1 | යෙන් 20,000 | යෙන් 200,000 | යෙන් 600,000 | යෙන් 1,100,000ක් පමණ |
| අර්ධ-කාලීන පාසල (රජයේ) | | යෙන් 950 | යෙන් 2,100 | යෙන් 32,400 | යෙන් 50,000ක් පමණ |
| දුරස්ථ අධ්‍යයන පාඨමාලාව (රජයේ) | | යෙන් 800 | යෙන් 500 | ඒකකයකට/වසරකට යෙන් 330 | යෙන් 40,000ක් පමණ |

※1 පෞද්ගලික උසස් පාසල් තමන්ගේම පාසල් අධ්‍යයන ගාස්තු නියම කරයි. මේ උදාහරණයකි.

## ■ උපකාරක පන්ති ගාස්තු සඳහා මූල්‍ය ආධාර

○ වාර්ෂික ආදායම දළ වශයෙන් යෙන් මිලියන 9.1 ට අඩු පවුල් රජයේ උසස් පාසල්වල පාසල් අධ්‍යයන ගාස්තු වලින් නිදහස් වේ. (※2) (ඇතැම් විවිධ ගාස්තු හැර).

※2 දැනට කනිෂ්ඨ උසස් පාසලේ තුන්වන වසරේ ඉගෙනුම ලබන, යෙන් මිලියන 9.1ට වැඩි ආදායමක් ඇති සිසුන්ට, උසස් පාසලේ දෙවන වසරේ සිට නොමිලේ අධ්‍යාපනය ලැබේ.

○ පෞද්ගලික උසස් පාසල් සඳහා නොමිලේ උපකාරක පන්ති පද්ධතිය

දැනට කනිෂ්ඨ උසස් පාසලේ තුන්වන වසරේ සිටින සිසුන්ට ඔවුන්ගේ උසස් පාසලේ දෙවන වසරේ සිට නොමිලේ උපකාරක පන්ති ලැබේ.

(සියලුම පෞද්ගලික උසස් පාසල් නොමිලේ උපකාරක පන්ති ලබා නොදේ. කරුණාකර පහත තොරතුරු බලන්න (ජපන් භාෂාවෙන් පමණක් ලබා ගත හැක)

URL : https://www.pref.osaka.lg.jp/documents/9385/middleschool - flyer1.pdf

<u>රජයේ හෝ පෞද්ගලික උසස් පාසලකට ඇතුළත් වූ පසු දෙමාපියන්/භාරකරුවන් අවශ්‍ය ලියකියවිලි. ඉදිරිපත් කළ යුතුය</u>

මට ගාස්තු ගෙවීමට නොහැකි නම් මා කළ යුත්තේ කුමක්ද?

⇒ කරුණාකර 21 සිට 23 දක්වා පිටු බලන්න.


# ප්‍රවේශ විභාග " න්‍යුගකු ෂිකෙන් "

**උසස් පාසලට ඇතුළත් වීමට ප්‍රථම ප්‍රවේශ විභාගය සමත්විය යුතුය. ඇතුළත්වීමේ විභාගය "න්‍යූෂි," "න්‍යුගකුෂා සෙම්බත්සු" හෝ "සෙම්බත්සු"** ***ලෙසද හැඳින්වේ.*** **පහත දැක්වෙන්නේ උසස් පාසල් ඇතුළත් කිරීමේ පරීක්ෂණ ක්‍රියා පටිපාටිය පිළිබඳ පැහැදිලි කිරීමකි.**


■ ප්‍රවේශ විභාගයේ සිට පාසලකට ඇතුළත්වීමේ අදියර

◎ <u>පෞද්ගලික උසස් පාසල්වලට පමණක් පිවිසීම සඳහා</u>

(පෞද්ගලික පාසල වෙත අයදුම් කිරීම)





මෙහිදී ඔබ පෞද්ගලික උසස් පාසලකට ඇතුළත්වීම සඳහා වූ ප්‍රවේශ විභාගයක් සමත් වුවහොත් ඔබ එම පාසලට ඇතුළත් විය යුතුය. එය සමත්වීමෙන් ඔබට රජයේ උසස් පාසලකට ඇතුළු වීමට නොහැක.




※ ඇතැම් උසස් පාසල් සහ පාඨමාලා සඳහා පමණක් පරිපාලනය වේ


## ◎ <u>රජයේ උසස් පාසල වෙත පිවිසීම</u>

(රජයේ පාසල වෙත අයදුම් කිරීම)
මෙහිදී ඔබ කිසිදු පෞද්ගලික පාසලක ප්‍රවේශ විභාගයකට ලියාපදිංචි නොවී රජයේ පාසල වෙත ප්‍රවේශය තෝරාගනියි.




※ ඇතැම් උසස් පාසල් සහ පාඨමාලා සඳහා පමණක් පරිපාලනය වේ.

(රජයේ සහ පෞද්ගලික උසස් පාසල් වෙත අයදුම් කිරීම)
පෞද්ගලික පාසල බහුවිධ අයදුම්පත් පිළිගන්නේ නම් රජයේ පාසලකට ඇතුළත් වීමට අපේක්ෂා කරන සිසුවෙකුට පෞද්ගලික පාසල් ප්‍රවේශ විභාගයට ද පෙනී සිටිය හැකිය. මෙහිදී පෞද්ගලික පාසල් ප්‍රවේශ විභාගය සමත් වුවද සිසුවාට රජයේ පාසල් ප්‍රවේශ විභාගයට ඉදිරිපත් විය හැකිය. එය සමත්වීමෙන් රජයේ පාසලකට ප්‍රවේශ වීමට තෝරාගැනීමේ අවස්ථාව ලැබේ.




※ ඇතැම් උසස් පාසල් සහ පාඨමාලා සඳහා පමණක් පරිපාලනය වේ.

# රජයේ උසස් පාසල්:
# ප්‍රවේශ විභාගයෙන් ආවරණය වන විෂයයන්

**ප්‍රවේශ විභාගයෙන් ආවරණය වන විෂයයන් පාඨමාලාව අනුව වෙනස් වේ. පහත දැක්වෙන්නේ පාඨමාලා සඳහා වන විෂයයන් සහ ඒ සඳහා යොදාගැනෙන අධ්‍යයන සහ වෙනත් පරීක්ෂණ පිළිබඳ හැඳින්වීමකි.**

## ■ විශේෂ තේරීම (පෙබරවාරි මැද සහ අවසානය අතර) ※2

| පාඨමාලා වර්ග | | අධ්‍යයන සහ වෙනත් පරීක්ෂණ |
|---|---|---|
| පූර්ණ කාලීන ඒකාබද්ධ අධ්‍යයන පාඨමාලාව | කර්මාන්ත ක්ෂේත්‍රය ආශ්‍රිත පාඨමාලා (වාස්තුවිද්‍යාත්මක සැලසුම්, ගෘහ නිර්මාණ සැලසුම්, නිෂ්පාදන සැලසුම්, වීඩියෝ සහ චිත්‍රපට නිර්මාණය, දෘශ්‍ය නිර්මාණ සහ සැලසුම් පද්ධතිය), විශ්ව ගවේෂණ, ලලිත කලා, ශාරීරික අධ්‍යාපනය, විනෝදාස්වාද සම්පාදනය, රංග කලාව, සංගීතය, සහ සමෝධානික කලා | විෂයයන් පහක් (ජපන් භාෂා, සමාජ අධ්‍යයනය, ගණිතය, විද්‍යාව, සහ ඉංග්‍රීසි ※1) ප්‍රායෝගික කුසලතා පරීක්ෂණය |
| | ඒකාබද්ධ අධ්‍යයන පාඨමාලාව (අනු පාසල/ ස්ටෙප් ස්කූල්) | විෂයයන් තුනක් (ජපන් භාෂාව, ගණිතය සහ ඉංග්‍රීසි ※1) සම්මුඛ පරීක්ෂණය ※3 |
| | ඒකාබද්ධ අධ්‍යයන පාඨමාලාව ( බලගැන්වීමේ පාසල ) | විෂයයන් පහක් (ජපන් භාෂාව, සමාජ අධ්‍යයනය, ගණිතය, විද්‍යාව, සහ ඉංග්‍රීසි ※1) සම්මුඛ පරීක්ෂණය |
| බහු අධ්‍යයන සම්භාර පද්ධති 1 සහ 2 සැසි (නිර්මාණාත්මක පාසල) | | |
| දිවාකාල සහ සන්ධ්‍යා කාල; අධ්‍යයන සම්භාර පද්ධති | | |

## ■ සාමාන්‍ය ප්‍රවේශ විභාග (මාර්තු මුල සහ මැද භාගය අතර) ※2

| පාඨමාලා වර්ග | | අධ්‍යයන සහ වෙනත් පරීක්ෂණ |
|---|---|---|
| පූර්ණ කාලීන ඒකාබද්ධ අධ්‍යයන පාඨමාලාව | විශේෂ විභාගයක් අවශ්‍ය නොවන සියලුම අධ්‍යයන පාඨමාලා | විෂයයන් පහක් (ජපන් භාෂා, සමාජ අධ්‍යයනය, ගණිතය, විද්‍යාව සහ ඉංග්‍රීසි ※1) |
| අර්ධකාලීන පාසල් අධ්‍යාපනය ※4 | | විෂයයන් තුනක් (ජපන් භාෂාව, ගණිතය සහ ඉංග්‍රීසි ※1) |
| දුරස්ථ අධ්‍යයන පාඨමාලාව ※5 | | සම්මුඛ පරීක්ෂණය |

※1 ඉංග්‍රීසි විභාගයට සවන්දීමේ පරීක්ෂණයක් ඇතුළත් වේ.

※2 ඔබට COVID-19 හෝ ඉන්ෆ්ලුවෙන්සා ආදිය හේතුවෙන් ප්‍රවේශ විභාගයකට මුහුණ දීමට නොහැකි නම්, වෙනත් දිනයක විභාග පරීක්ෂණයක් සංවිධානය කළ හැකි දැයි ඔබේ කනිෂ්ඨ උසස් පාසලෙන් උපදෙස් විමසන්න.

※3 අයදුම් කරන අවස්ථාවේදී, ඉදිරිපත් වන්නේ පුද්ගල සම්මුඛ පරීක්ෂණයකටද ලිඛිත සම්මුඛ පරීක්ෂණයකට දැයි තෝරා ගත හැකිය.

※4 වයස අවුරුදු 21 හෝ ඊට වැඩි අයදුම්කරුවන් අධ්‍යයන ලේඛනයක් ඉදිරිපත් කිරීම අවශ්‍ය නැත.. කෙසේ වෙතත්, එවැනි අයදුම්කරුවන්ට ලිඛිත අධ්‍යයන පරීක්ෂණවලට අමතරව සම්මුඛ පරීක්ෂණයක් පැවැත්වීම අවශ්‍ය වේ. අයදුම්කරු කැමති නම්, අධ්‍යයන පරීක්ෂණ වෙනුවට කෙටි රචනයක් ලිවිය හැකිය.

※5 වයස අවුරුදු 21 හෝ ඊට වැඩි අයදුම්කරුවන් අධ්‍යයන ලේඛනයක් ඉදිරිපත් කිරීම අවශ්‍ය නැත..

## ■ දෙවන තේරීම (මාර්තු අග)

| පාඨමාලා වර්ග | අධ්‍යයන සහ වෙනත් පරීක්ෂණ |
|---|---|
| සාර්ථක අපේක්ෂකයින් ප්‍රමාණය පවතින ස්ථාන සංඛ්‍යාව ඉක්මවන පාඨමාලා | සම්මුඛ පරීක්ෂණය |

## ■ වෙනත් ආකාරයේ තිරගත කිරීම් (පෙබරවාරි මැද සහ අවසානය අතර) ※2

| තේරීම් / පාසල්, පාඨමාලා ආදිය. | අධ්‍යයන සහ වෙනත් පරීක්ෂණ |
|---|---|
| ඔසාකා ප්‍රාන්තයේ තොයොනකා උසස් පාසලේ නොසෙ ශාඛාව සඳහා ප්‍රවේශ විභාගය<br>තොයොනකා උසස් පාසල ※2<br>නොසෙ ශාඛාව (ඒකාබද්ධ අධ්‍යයන පාඨමාලාව) | විෂයයන් පහක්<br>(ජපන් භාෂාව, සමාජ අධ්‍යයනය, ගණිතය, විද්‍යාව සහ ඉංග්‍රීසි ※1)<br>සම්මුඛ පරීක්ෂණය |
| විදේශයන්හි සිට ආපසු පැමිණෙන්නන් සඳහා ප්‍රවේශ විභාගය※2 ※5<br>ඉංග්‍රීසි පාඨමාලාව, අන්තර් සංස්කෘතික අධ්‍යයන පාඨමාලාව, ගෝලීය අධ්‍යයන පාඨමාලාව, විශ්ව ගවේෂණ පාඨමාලාව සහ ඒකාබද්ධ විද්‍යා පාඨමාලාව | ගණිතය, ඉංග්‍රීසි※1 සහ<br>සම්මුඛ පරීක්ෂණය<br>(කරුණාකර 15 පිටුව බලන්න.) |
| ජපන් භාෂා සහය අවශ්‍ය විදේශීය සිසුන් සහ ආපසු පැමිණෙන සිසුන් සඳහා ප්‍රවේශ විභාගය ※2 ※6<br>හිගෂි යොදොගවා උසස් පාසල (සාමාන්‍ය අධ්‍යයන පාඨමාලාව)<br>ෆුකුයි උසස් පාසල (ඒකාබද්ධ අධ්‍යයන පාඨමාලාව)<br>කදොමා නම්හයා උසස් පාසල (ඒකාබද්ධ අධ්‍යයන පාඨමාලාව)<br>යඕ කිතා උසස් පාසල (ඒකාබද්ධ අධ්‍යයන පාඨමාලාව)<br>සෙයිබි උසස් පාසල (ඒකාබද්ධ අධ්‍යයන පාඨමාලාව)<br>නගයොෂි උසස් පාසල (ඒකාබද්ධ අධ්‍යයන පාඨමාලාව; බලගැන්වීමේ පාසල)<br>ෆුසෙ කිතා උසස් පාසල (ඒකාබද්ධ අධ්‍යයන පාඨමාලාව; බලගැන්වීමේ පාසල)<br>ඔසාකා වකබා උසස් පාසල (බහු අධ්‍යයන සම්භාර පද්ධති පළමු සහ දෙවන සැසි (නිර්මාණාත්මක පාසල) | ගණිතය, ඉංග්‍රීසි※1, සහ රචනාව<br>(ජපන් හැර වෙනත් භාෂාවකින් ලිවිය හැක.)<br>(කරුණාකර 16 පිටුව බලන්න.) |
| බුද්ධිමය ආබාධ සහිත සිසුන් සඳහා ස්වාධීන උපකාරක පාඨමාලාව සඳහා තේරීම ※2 ※7<br>සාමාන්‍ය අධ්‍යයන පාඨමාලාව<br>මල් කර්මාන්ත, පාරිසරික හරිත රසායන විද්‍යාව, ජීව විද්‍යාව යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාව, විදුලි ඉංජිනේරු විද්‍යාව, විද්‍යාව ඒකාබද්ධ අධ්‍යයන පාඨමාලාව<br>ඒකාබද්ධ අධ්‍යයන පාඨමාලාව (විවිධ අධ්‍යාපනික භාවිතයන් සහිත පාසල් (අනු පාසල/ ස්ටෙප් ස්කූල්) | සම්මුඛ පරීක්ෂණය |

※1 ඉංග්‍රීසි විභාගයට සවන්දීමේ පරීක්ෂණයක් ඇතුළත් වේ.

※2 ඔබට COVID-19 හෝ ඉන්ෆ්ලුවෙන්සා ආදිය හේතුවෙන් ප්‍රවේශ විභාගයකට මුහුණ දීමට නොහැකි නම්, වෙනත් දිනයක විභාග පරීක්ෂණයක් සංවිධානය කළ හැකි දැයි ඔබේ කනිෂ්ඨ උසස් පාසලෙන් උපදෙස් විමසන්න.

※5 අධ්‍යයන ලේඛනයක් අවශ්‍ය නොවේ.

※6 අධ්‍යයන ලේඛනයක් හෝ ස්වයං තක්සේරු වාර්තාවක් අවශ්‍ය නොවේ.

※7 ආබාධිත සහතිකය "ර්යෝඉකු-තෙචෝ" අවශ්‍යයි

විශේෂ අවකාශ සහිත ප්‍රවේශ විභාග සඳහා සාමාන්‍ය අවශ්‍යතාවන්ට අමතරව අතිරේක සුදුසුකම් අවශ්‍ය වේ. අයදුම්පතක් ඉදිරිපත් කිරීමට පෙර, කරුණාකර නිශ්චිත අවශ්‍යතා දැනගැනීමට අදාළ නගර සභාවේ අධ්‍යාපන මණ්ඩලය සම්බන්ධ කර ගන්නා ලෙස ඔබේ කනිෂ්ඨ උසස් පාසලෙන් ඉල්ලා සිටින්න.

ඔසාකා ප්‍රාන්තයේ තොයොනකා උසස් පාසලේ නොසෙ ශාඛාව සඳහා ප්‍රවේශ විභාගයට සාමාන්‍ය අවශ්‍යතාවන්ට අමතරව, වෙනත් සුදුසුකම් අවශ්‍ය නොවේ.

# රජයේ උසස් පාසල්:
# ප්‍රවේශ නිර්ණායක

**ඔබ ප්‍රවේශ විභාගය සමත් වීමේ නිර්ණායක පරීක්ෂා කර ඒ අනුව සූදානම් විය යුතුය.**

ප්‍රවේශ විභාගයේ ප්‍රතිඵල, අධ්‍යයන යෝග්‍යතා පරීක්ෂණය, අධ්‍යයන ලේඛනයේ අන්තර්ගතය, ස්වයං තක්සේරු වාර්තාව සහ සම්මුඛ පරීක්ෂණ ප්‍රතිඵල මත පදනම්ව සාර්ථක අපේක්ෂකයින් තීරණය කරනු ලැබේ.

### ■ අධ්‍යයන ලේඛනය "චොසෂෝ"

අධ්‍යයන ලේඛනයක් යනු ශිෂ්‍යයා අයත් වූ හෝ අයත් වන කනිෂ්ඨ උසස් පාසලේ ගුරුවරයෙකු විසින් සකස් කරන ලද ලිඛිත වාර්තාවකි. මෙම ලේඛනය අයදුම්කරු ඇතුළු වීමට අපේක්ෂා කරන උසස් පාසල් වෙත යවනු ලැබේ. එයට විෂයයන් නවයක අධ්‍යයන ප්‍රතිඵල ඇතුළත් වේ. (“හ්‍යොතෙයි” ලෙස හැඳින්වේ) විෂයයන් නවයේ ප්‍රතිඵල, (ජපන් භාෂාව, සමාජ අධ්‍යයනය, ගණිතය, විද්‍යාව, ඉංග්‍රීසි, සංගීතය, ලලිත කලා, ශාරීරික අධ්‍යාපනය සහ සෞඛ්‍ය අධ්‍යයනය, සහ හස්ත කලා සහ ගෘහ ආර්ථික විද්‍යාව) සහ ශිෂ්‍යයා සම්බන්ධ ක්‍රියාකාරකම් සහ හැසිරීම් පිළිබඳ වාර්තා (උදා: ශිෂ්‍ය සංගමයට දායක වීම, පාසල් කමිටුව, සංගම් සහ ශිෂ්‍යයාගේ සාමාන්‍ය හැසිරීම් පිළිබඳ වාර්තා ඇතුළත් වේ. මෙම ලේඛනයේ අධ්‍යයන ප්‍රතිඵල 1(අඩුම) සිට 5 දක්වා (වැඩිම) ශ්‍රේණිගත කර ඇත.

### ■ ස්වයං තක්සේරු වාර්තාව "ජිකෝ-ෂිංකොකුෂෝ"

අයදුම් පත්‍රය සමඟ ස්වයං තක්සේරු වාර්තාවක් ඉදිරිපත් කරන අතර, එහි අයදුම්කරුගේ පූර්ව අධ්‍යයනයේ සාරාංශයක් සහ ඔහු හෝ ඇය ඇතුළත් වීමට කැමති උසස් පාසල විසින් පූර්ව විනිශ්චය කර, ලබා දී ඇති තේමාව අනුව ලියූ උසස් පාසල් ජීවිතය සඳහා වූ අභිලාෂයන් සහ දැක්ම පිළිබඳ සාරාංශයක් ඇතුළත් වේ.

(ජපන් භාෂා සහය අවශ්‍ය විදේශ සිසුන් සහ විදේශයන්හි සිට ආපසු පැමිණෙන්නන් සඳහා වූ ප්‍රවේශ විභාගයට ස්වයං තක්සේරු වාර්තාවක් අවශ්‍ය නොවේ)

### ■ සම්මුඛ පරීක්ෂණය "මෙන්සෙත්සු"

සම්මුඛ පරීක්ෂණයේදී, උසස් පාසලේ පරීක්ෂකයින් ස්වයං තක්සේරු වාර්තාවේ අන්තර්ගතය මත පදනම්ව අයදුම්කරුගෙන් ප්‍රශ්න කරනු ඇත.

සම්මුඛ පරීක්ෂණයක් අවශ්‍ය කුමන පාඨමාලා සඳහා ද යන්න තහවුරු කිරීමට කරුණාකර 12 සහ 13 පිටු බලන්න.

**මූලික වශයෙන්, උසස් පාසල් අයදුම්කරුගේ අධ්‍යයන කාර්ය සාධනය, ඔවුන්ගේ ස්වයං-තක්සේරු වාර්තාවේ අන්තර්ගතය සහ පාසලේ ම ඇතුළත් වීමේ ප්‍රතිපත්තිය (ඔවුන්ගේ අපේක්ෂිත කුසලතා සහ සිසුන්ගේ චරිතය) සමඟ කෙතරම් ගැළපේදැයි පරීක්ෂා කිරීමෙන් අපේක්ෂකයන් තෝරාගනු ලබයි.**

**ස්වයං තක්සේරු වාර්තාව සකස් කරන අතරතුර අයදුම් කිරීමට අපේක්ෂා කරන පාසලේ හෝ පාසල්වල ඇතුළත් වීමේ ප්‍රතිපත්තිය කියවා දැන ගැනීමට ප්‍රවේශම් වන්න.**

# රජයේ උසස් පාසල්:

# ආපසු පැමිණෙන සිසුන් සඳහා ප්‍රවේශ විභාගය

**ජපානයට ආපසු පැමිණෙන සිසුන් සඳහා සහ විදේශීය සිසුන් සඳහා විශේෂ විභාග තිබේ (පිටු අංක15). රජයේ උසස් පාසල් ප්‍රවේශ විභාගයට මුහුණ දීමේ දී ඔවුන්ට ජපන් භාෂා සහය අවශ්‍ය වේ (පිටු අංක16).**

ආපසු පැමිණෙන සිසුන් සඳහා ප්‍රවේශ විභාගය

■ **ඉලක්ක කණ්ඩායම**

අඛණ්ඩව වසර 2 ක් හෝ ඊට වැඩි කාලයක් විදේශගතව ජීවත් වූ හෝ ජපානයේ වසර 2 ක් හෝ ඊට අඩු කාලයක් ජීවත් වූ අපේක්ෂකයන්

■ **පාඨමාලා නම්**

ඉංග්‍රීසි පාඨමාලාව, අන්තර් සංස්කෘතික අධ්‍යයන පාඨමාලාව, ගෝලීය අධ්‍යයන පාඨමාලාව, විශ්ව ගවේෂණ පාඨමාලාව, සහ ඒකාබද්ධ විද්‍යා පාඨමාලාව

■ **අන්තර්ගතය**

○ මෙම විභාගයෙන් ආවරණය වන විෂයයන් වන්නේ ගණිතය, ඉංග්‍රීසි සහ සම්මුඛ පරීක්ෂණයකි. (සම්මුඛ පරීක්ෂණය ජපන් භාෂාවෙන් සිදු කෙරේ)

○ ගණිතය සහ ඉංග්‍රීසි විභාග සඳහා, සෑම අපේක්ෂකයෙකුටම තම අභිමතය පරිදි එක් ද්විභාෂා ශබ්ද කෝෂයක් (ජපන් සහ වෙනත් භාෂාවක) ගෙන ඒමට අවසර ඇත. කෙසේ වෙතත්, ඉංග්‍රීසි පරීක්ෂණය සඳහා අපේක්ෂකයාට ඉංග්‍රීසි/ජපන් පරිවර්තන ශබ්දකෝෂයක් හෝ ඉංග්‍රීසි භාෂාවෙන් ලියා ඇති ශබ්දකෝෂයක් භාවිත කළ නොහැක.

# රජයේ උසස් පාසල්:
# ජපන් භාෂා සහය අවශ්‍ය විදේශීය සිසුන් සහ ආපසු පැමිණෙන සිසුන් සඳහා ප්‍රවේශ විභාගය

ජපන් භාෂා සහය අවශ්‍ය විදේශීය සිසුන් සහ ආපසු පැමිණෙන සිසුන් සඳහා ප්‍රවේශ විභාගය

■ **ඉලක්ක කණ්ඩායම**

මූලික වශයෙන්, චීනයෙන් හෝ වෙනත් රටවලින් ආපසු පැමිණි අය හෝ ප්‍රාථමික පාසලේ 4 වන ශ්‍රේණියට හෝ ඊට වැඩි ශ්‍රේණියකට ඇතුළත් කර ඇති විදේශීය ජාතිකයන්

■ **2025 අධ්‍යයන වර්ෂය තුළ විභාගය පවත්වන පාසල්**

**(2025 පෙබරවාරි මස පැවැත්වීමට නියමිත)**

හිගෂි යොදොගවා උසස් පාසල (සාමාන්‍ය අධ්‍යයන පාඨමාලාව)
ෆුකුයි උසස් පාසල (ඒකාබද්ධ අධ්‍යයන පාඨමාලාව)
කදොමා නම්හයා උසස් පාසල (ඒකාබද්ධ අධ්‍යයන පාඨමාලාව)
යඔ කිතා උසස් පාසල (ඒකාබද්ධ අධ්‍යයන පාඨමාලාව)
සෙයිබි උසස් පාසල (ඒකාබද්ධ අධ්‍යයන පාඨමාලාව)
නගයොෂි උසස් පාසල (ඒකාබද්ධ අධ්‍යයන පාඨමාලාව; බලගැන්වීමේ පාසල)
ෆුසෙ කිතා උසස් පාසල (ඒකාබද්ධ අධ්‍යයන පාඨමාලාව; බලගැන්වීමේ පාසල)
ඔසාකා වකබා උසස් පාසල (බහු අධ්‍යයන සම්භාර පද්ධති 1 (නිර්මාණාත්මක පාසල))

■ **අන්තර්ගතය**

○ විභාගයේ විෂයයන් වන්නේ ලිවීම, ගණිතය සහ ඉංග්‍රීසි (ශ්‍රවණ පරීක්ෂණය ඇතුළත්) ය.

○ රචනාව ජපන් හැර වෙනත් භාෂාවකින් ලිවිය හැකිය.

○ ප්‍රවේශ විභාගයේදී ෆුරිගනා (කන්ජි අක්ෂර උච්චාරණය විස්තර කරන) කන්ජි සමඟ මුද්‍රණය කළ හැක.

○ රචනා කාර්යයන් සඳහා, ප්‍රශ්නය තේරුම් ගැනීමට උපකාරී වන මූල පද විදේශ භාෂාවලින් ලබා දෙනු ඇත.

○ විභාගයට පෙනී සිටින විට අපේක්ෂකයාට ශබ්ද කෝෂ දෙකක් භාවිත කළ හැකිය. කෙසේ වෙතත්, ඉංග්‍රීසි පරීක්ෂණය සඳහා, අපේ කයාට ඉංග්‍රීසි/ජපන් පරිවර්තන ශබ්දකෝෂයක් හෝ ඉංග්‍රීසියෙන් ලියා ඇති ශබ්දකෝෂයක් භාවිත කළ නොහැක.

※ ස්වයං තක්සේරු වාර්තාවක් අවශ්‍ය නොවේ.

※ මෙම විභාගයට මුහුණ දිය හැකි අයදුම්කරුවන් ඔසාකා ප්‍රාන්ත අධ්‍යාපන නියෝජිතායතනය විසින් නොවැම්බර් මස දී තහවුරු කරනු ලැබේ. ඔබගේ පැමිණීමේ සහ පිටවීමේ ඉතිහාසය වැනි ලේඛන ඉදිරිපත් කිරීම අවශ්‍ය වේ.

තහවුරු කිරීම සඳහා කාලය ගත විය හැකි බැවින් අයදුම්කරුවන් මධ්‍යම පාසලේ සිටියදීම හැකි ඉක්මනින් ගුරුවරුන් සමඟ සම්බන්ධ විය යුතුය.

ඔබ පිටු අංක 15 සහ 16 ආවරණය වන ප්‍රවේශ විභාගයන්ට මුහුණදීමට අවශ්‍ය නම්, ඔබ දැනට අධ්‍යාපනය ලබන මධ්‍යම පාසල විසින් විධිවිධාන සලසනු ඇත. වැඩිදුර තොරතුරු සඳහා කරුණාකර ඔබේ පන්ති භාර ගුරුවරයාගෙන් විමසන්න.

# රජයේ උසස් පාසල්:

# ජපන් භාෂා සහය අවශ්‍ය අනෙකුත් සිසුන් සහ ආපසු පැමිණෙන සිසුන් සඳහා විශේෂ අවකාශ

**ජපන් භාෂා සහය අවශ්‍ය ජපානයට ආපසු පැමිණෙන සිසුන්ට සහ විදේශිකයන්ට රජයේ උසස් පාසල් සඳහා ප්‍රවේශ විභාගයට පෙනී සිටීමේදී විශේෂ අවකාශ ලබා දිය හැකිය. ඒ සඳහා ඔබට අයදුම් කළහැකිදැයි කරුණාකර ඔබේ පන්ති භාර ගුරුවරයාගෙන් විමසන්න.**

අවකාශ ①

■ **ඉලක්ක කණ්ඩායම**

මූලික වශයෙන්, ජපානයට පැමිණීමෙන් හෝ ආපසු පැමිණීමෙන් පසු ප්‍රාථමික පාසලේ පළමු ශ්‍රේණියට හෝ ඉහළට මාරු වූ අය හෝ මධ්‍යම පාසලකට ඇතුළත් වූ හෝ මාරු කර ඇති සිසුන්

■ **ඉලක්ක උසස් පාසල්**

සියලුම රජයේ උසස් පාසල්

■ **අන්තර්ගතය**

**<u>A: විභාග කාලය දීර්ඝ කිරීම (ආසන්න වශයෙන් 130%)</u>**

A අනුමත කර ඇත්නම්, A අවකාශ ලබා ගන්නා අපේක්ෂකයින්ට පහත විස්තර කර ඇති පරිදි B, C, සහ D සඳහා අයදුම් කළ හැකිය.

**<u>B: විභාගය අතරතුර ශබ්ද කෝෂ භාවිතා කිරීමට අවසර ඇත.</u>**

අයදුම්කරුවන්ට උපරිම ශබ්ද කෝෂ දෙකක් විභාගයට ගෙන ඒමට හැකිය. කෙසේ වෙතත්, ඉංග්‍රීසි පරීක්ෂණය සඳහා අපේක්ෂකයාට ඉංග්‍රීසි/ජපන් පරිවර්තන ශබ්දකෝෂයක් හෝ ඉංග්‍රීසියෙන් ලියා ඇති ශබ්දකෝෂයක් භාවිත කළ නොහැක. තවද, ඉලෙක්ට්‍රොනික ශබ්දකෝෂ තහනම් වේ. ශබ්දකෝෂ අවශ්‍ය අයදුම්කරුවන් සඳහා කන්ජි සාක්ෂරතා පරීක්ෂණය පවත්වනු නොලැබේ.

**<u>C: ශාස්ත්‍රීය යෝග්‍යතා පරීක්ෂණයේදී ඉල්ලීම පරිදි කන්ජි අක්ෂර සමඟ ෆුරිගනා *මුද්‍රණය කළ හැක*</u>**

කෙසේ වෙතත්, ජපන් භාෂා පරීක්ෂණය සඳහා, කන්ජි අක්ෂරයන්හි උච්චාරණය කුමක්දැයි අසන ප්‍රශ්නවල ෆුරිගනා යොදනු නොලැබේ.

**<u>D: ජපන් භාෂා පරීක්ෂණයේදී රචනා හෝ රචනා ශෛලියේ ප්‍රශ්න ඇති විට, ප්‍රශ්න තේරුම් ගැනීම සඳහා මූල පද ජපන් භාෂාවෙන් හැර වෙනත් භාෂාවකින් ද සපයනු ලැබේ.</u>**

අවකාශ ②

■ **ඉලක්ක කණ්ඩායම**

අඛණ්ඩව වසර 2 ක් හෝ ඊට වැඩි කාලයක් විදේශගතව ජීවත් වූ සහ වසර 2 ක් හෝ ඊට අඩු කාලයක් ජපානයේ ජීවත් වූ අපේක්ෂකයන්.

■ **ඉලක්ක උසස් පාසල්**

සියලුම රජයේ උසස් පාසල්

■ **අන්තර්ගතය**

ඔබේ ස්වයං තක්සේරු වාර්තාව ඔබේ ගුරුවරයා හෝ ඔබේ භාරකරුවන් විසින් ඔබ වෙනුවෙන් ලිවිය හැක. එය ඔවුන්ට ලිවිය නොහැකි නම් සහ ඔබම එය ලියන්නේ නම්, ජපන් භාෂාව හැර වෙනත් භාෂා භාවිත කළ හැකිය.

ඔබට මෙම අවකාශ ලබා ගැනීමට අවශ්‍ය නම්, කරුණාකර ඔබ දැනට අධ්‍යාපනය ලබන මධ්‍යම පාසලේ පන්ති භාර ගුරුවරයා හමුවී පාසල හරහා ඔසාකා ප්‍රාන්ත අධ්‍යාපන නියෝජිතායතනය වෙත අයදුම් කළ හැකිය.

(*) විශේෂ අවකාශයන්හි විස්තර වෙනස් විය හැකි අතර 2024 ජූලි සහ අගෝස්තු අතර නිල වශයෙන් ප්‍රකාශ කරනු ඇත.

# රජයේ උසස් පාසල්:

# 2025 පාසල් වර්ෂය සඳහා ප්‍රවේශ විභාග කාලසටහන

**පාඨමාලාව සහ විෂය අනුව අයදුම් කිරීමේ කාලසීමාවන්, විභාග දිනයන් සහ ප්‍රවේශය සඳහා ප්‍රතිඵල නිවේදනය වෙනස් වේ. ඔබ අයදුම් කරන උසස් පාසල් සහ විෂයයන් සඳහා කාලසටහන පරීක්ෂා කිරීමට වග බලා ගන්න.**

| | | තේරීම් වර්ග | අයදුම් කිරීමේ කාලය | පරීක්ෂණ අන්තර්ගතය සහ විභාග දිනය※ | ප්‍රතිඵල නිවේදනය |
|---|---|---|---|---|---|
| විශේෂ තේරීම | පූර්ණ කාලීන පාඨමාලා | · කර්මාන්ත ක්ෂේත්‍රය සම්බන්ධ පාඨමාලා (වාස්තුවිද්‍යාත්මක සැලසුම්, ගෘහ අලංකරණ සැලසුම්, නිෂ්පාදන සැලසුම්, වීඩියෝ සහ චිත්‍රපට නිර්මාණය, දෘශ්‍ය නිර්මාණ සහ සැලසුම් පද්ධතිය), විශ්ව ගවේෂණ, ලලිත කලා, ශාරීරික අධ්‍යාපනය, විනෝදාස්වාද සම්පාදනය, රංග කලාව, සංගීතය, සහ සමෝධානික කලා | පෙබරවාරි 14 (සිකුරාදා) සිට පෙබරවාරි 17 (සඳුදා) | ශාස්ත්‍රීය පරීක්ෂණය පෙබරවාරි 20 (බ්‍රහස්පතින්දා) ප්‍රායෝගික කුසලතා පරීක්ෂණය පෙබරවාරි 21 (සිකුරාදා) | මාර්තු 3 (සඳුදා) |
| | | සංගීත පාඨමාලාව | පෙබරවාරි 04 (අඟහරුවාදා) සිට පෙබරවාරි 05 (බදාදා) | ගායන ප්‍රවීණතා පරීක්ෂණය / සංගීත භාණ්ඩ ප්‍රවීණතා පරීක්ෂණය පෙබරවාරි 15 (සෙනසුරාදා) සංගීතය සඳහා ශාස්ත්‍රීය පරීක්ෂණය සහ සවන්දීමේ පරීක්ෂණය පෙබරවාරි 20 (බ්‍රහස්පතින්දා) | |
| | | ඒකාබද්ධ අධ්‍යයන පාඨමාලාව (විවිධ අධ්‍යාපනික භාවිත සහිත පාසල් (අනු පාසල/ ස්ටෙප් ස්කූල්) | පෙබරවාරි 14 (සිකුරාදා) සිට පෙබරවාරි 17 (සඳුදා) | ශාස්ත්‍රීය පරීක්ෂණය පෙබරවාරි 20 (බ්‍රහස්පතින්දා) සම්මුඛ පරීක්ෂණය හෝ පෙබරවාරි 21 (සිකුරාදා) හෝ පෙබරවාරි 25 (අඟහරුවාදා) | |
| | | ඒකාබද්ධ අධ්‍යයන පාඨමාලාව (බලගැන්වීමේ පාසල) | පෙබරවාරි 14 (සිකුරාදා) සිට පෙබරවාරි 17 (සඳුදා) | ශාස්ත්‍රීය පරීක්ෂණය පෙබරවාරි 20 (බ්‍රහස්පතින්දා) සම්මුඛ පරීක්ෂණය පෙබරවාරි 21 (සිකුරාදා) | |
| | බහු අධ්‍යයන සම්භාර පද්ධති 1 සහ 2 සැසි (නිර්මාණාත්මක පාසල) | | | | |
| | දිවාකාල සහ සන්ධ්‍යා අධ්‍යයන සම්භාර පද්ධති පන්ති | | | | |
| ඔසාකා ප්‍රාන්තයේ තොයොනකා උසස් පාසලේ නොසෙ ශාඛාව සඳහා ප්‍රවේශ විභාගය | | | පෙබරවාරි 14 (සිකුරාදා) සිට පෙබරවාරි 17 (සඳුදා) | ශාස්ත්‍රීය පරීක්ෂණය පෙබරවාරි 20 (බ්‍රහස්පතින්දා) සම්මුඛ පරීක්ෂණය පෙබරවාරි 21 (සිකුරාදා) | |
| ආපසු පැමිණෙන සිසුන් සඳහා ප්‍රවේශ විභාගය | | | | අධ්‍යයන පරීක්ෂණය සහ සම්මුඛ පරීක්ෂණය පෙබරවාරි 20 (බ්‍රහස්පතින්දා) | |
| ජපන් භාෂා සහය අවශ්‍ය විදේශීය සිසුන් සඳහා සහ ආපසු පැමිණෙන සිසුන් සඳහා ප්‍රවේශ විභාගය | | | | අධ්‍යයන පරීක්ෂණය සහ රචනාව පෙබරවාරි 20 (බ්‍රහස්පතින්දා) | |
| බුද්ධිමය ආබාධ සහිත සිසුන් සඳහා වන ස්වාධීන උපකාරක පාඨමාලාව සඳහා අතිරේක තේරීම | | | | සම්මුඛ පරීක්ෂණය පෙබරවාරි 19 (බදාදා) හෝ 20 (බ්‍රහස්පතින්දා) හෝ 21 (සිකුරාදා) | |

※ ඔබට COVID-19 හෝ ඉන්ෆ්ලුවෙන්සා ආදිය හේතුවෙන් ප්‍රවේශ විභාගයකට මුහුණ දීමට නොහැකි නම්, වෙනත් දිනයක විභාග පරීක්ෂණයක් සංවිධානය කළ හැකි දැයි ඔබේ කනිෂ්ඨ උසස් පාසලෙන් උපදෙස් විමසන්න.

| | | තේරීම් වර්ග | අයදුම් කිරීමේ කාලය | පරීක්ෂණ අන්තර්ගතය සහ විභාග දිනය※ | ප්‍රතිඵල නිවේදනය |
|---|---|---|---|---|---|
| සාමාන්‍ය තේරීම | පූර්ණ කාලීන පාඨමාලා | ·සාමාන්‍ය අධ්‍යයන පාඨමාලා (අධ්‍යයන සම්භාර පද්ධති සහිත පාසල් ඇතුළුව)<br>·වාණිජ්‍යය සම්බන්ධ පාඨමාලා<br>·ගෝලීය ව්‍යාපාර පාඨමාලා<br>·කෘෂිකාර්මික සම්බන්ධ පාඨමාලා<br>·කර්මාන්ත සම්බන්ධ පාඨමාලා<br>(විශේෂ තේරීම් කරන පාසල් පාඨමාලා හැර)<br>·ඉංග්‍රීසි ·අන්තර් සංස්කෘතික අධ්‍යයනය<br>·ගෝලීය අධ්‍යයන පාඨමාලාව<br>·විද්‍යාව සහ ගණිත පාඨමාලාව<br>·ඒකාබද්ධ විද්‍යා පාඨමාලාව<br>·විද්‍යා නිර්මාණ පාඨමාලාව<br>·මානව ශාස්ත්‍ර හා විද්‍යා පාඨමාලාව<br>·අධ්‍යාපනික මානව ශාස්ත්‍ර සහ විද්‍යා පාඨමාලාව<br>·සුබසාධන ස්වේච්ඡා පාඨමාලා<br>·ආහාර සංස්කෘතිය සඳහා පාඨමාලා<br>·ඒකාබද්ධ අධ්‍යයන පාඨමාලා<br>(නිර්මාණාත්මක පාසල් ඒකාබද්ධ අධ්‍යයන පාඨමාලා පිරිනමයි, නමුත් බලගැන්වීමේ පාසල් සහ විවිධ අධ්‍යාපනික භාවිතයන් සහිත පාසල් (අනු පාසල්/ස්ටෙප් ස්කූල්) එසේ නොකරයි.) | මාර්තු 5 (බදාදා)<br>සිට<br>මාර්තු 7<br>(සිකුරාදා) | ශාස්ත්‍රීය සහ වෙනත් පරීක්ෂණ<br>මාර්තු 12 (බදාදා) | මාර්තු 21<br>(සිකුරාදා) |
| | අර්ධකාලීන පාසල් අධ්‍යාපනය | | | | |
| | දුරස්ථ අධ්‍යයන පාඨමාලා | | මාර්තු 3 (සඳුදා)<br>සිට<br>මාර්තු 5 (බදාදා) | සම්මුඛ පරීක්ෂණය<br>මාර්තු 9 (ඉරිදා) හෝ 10 (සඳුදා) හෝ 11 (අඟහරුවාදා) | |
| අයදුම්කරුවන්ගේ ද්විතීයික තේරීම (මෙය පවතින පාසල් සඳහා) | | | මාර්තු 25<br>(අඟහරුවාදා) | සම්මුඛ පරීක්ෂණය<br>මාර්තු 26 (බදාදා) | මාර්තු 27<br>(බ්‍රහස්පතින්දා) |
| බුද්ධිමය ආබාධ සහිත සිසුන් සඳහා වන ස්වාධීන උපකාරක පාඨමාලාව සඳහා අතිරේක තේරීම<br>(මෙය පවතින පාසල් සඳහා) | | | | | |
| සරත් සෘතුවේ ඇතුළත් කිරීම් සඳහා තේරීම | | | 2025<br>සැප්තැම්බර් 8<br>(සඳුදා) | රචනය සහ සම්මුඛ පරීක්ෂණය<br>සැප්තැම්බර් 11, 2025<br>(බ්‍රහස්පතින්දා) | සැප්තැම්බර් 17, 2025 (බදාදා) |

※ ඔබට COVID-19 හෝ ඉන්ෆ්ලුවෙන්සා ආදිය හේතුවෙන් ප්‍රවේශ විභාගයකට මුහුණ දීමට නොහැකි නම්, වෙනත් දිනයක විභාග පරීක්ෂණයක් සංවිධානය කළ හැකි දැයි ඔබේ කනිෂ්ඨ උසස් පාසලෙන් උපදෙස් විමසන්න.

※මෙම වසරේ සිට අයදුම්පත් මාර්ගගතව කැඳවීම සිදු කෙරේ. වැඩි විස්තර සඳහා කරුණාකර 2D තීරු කේතය පරිලෝකනය කරන්න.


## පාසල් ගාස්තු සඳහා මූල්‍ය සහය

# උසස් පාසල් ප්‍රවේශය සඳහා මූල්‍ය සහය සපයන සංවිධාන

**උසස් පාසලට ඇතුළත් වීමට අවශ්‍ය මුදල සිසුන්ට ණයට ගත හැකි වේ. එයට අවශ්‍ය සුදුසුකම්, නිර්ණායක සහ ආපසු ගෙවීමේ ක්‍රමය පිළිබඳ වැඩිදුර තොරතුරු පහත ලැයිස්තුගත කර ඇති ණය සපයන ආයතනවලින් සෘජුවම විමසා දැන ගත හැකිය.**

| නම | ණය මුදල | අයදුම් කිරීම | විමසීම් |
|---|---|---|---|
| ඔසාකා ප්‍රාන්ත ශිෂ්‍යත්ව සංගමය | රජයේ උසස් පාසල: ¥100,000 දක්වා<br>පෞද්ගලික උසස් පාසල: ¥370,000 දක්වා | සැප්තැම්බර් මුල - ඔක්තෝබර් මුල. 3 වන වසරේ මධ්‍යම පාසල | දූ.ක. 06-6357-6272 |
| ජීවන සුබසාධන අරමුදල් | ¥500,000 දක්වා | ඇතුලත් වීමෙන් පසු අප්‍රේල් අවසානය දක්වා. | නාගරික සමාජ සුබසාධන සභාව |
| තනි මව් පවුල්, තනි පිය පවුල්, සහ වැන්දඹු සුබසාධන අරමුදල් | රජයේ උසස් පාසල (ඔබ නිවසේ සිට ගමන් කරන විට): ¥150,000 දක්වා<br>පුද්ගලික උසස් පාසල (ඔබ නිවසේ සිට ගමන් කරන විට) ¥410,000 දක්වා | අවශ්‍ය අරමුදල් ප්‍රමාණය දැනගත් විට කාර්යාලය හෝ ආයතනය සමඟ සෘජුව සම්බන්ධ වන්න. | ඔබේ නගරයේ හෝ අගනගරයේ සහ වෙනත් ආයතනවල සුබසාධන කාර්යාල |
| රිය අනතුරු සරණ ශිෂ්‍යත්ව සංගමය | ① යෙන් 200,000<br>② යෙන් 400,000<br>③ යෙන් 600,000<br>අයදුම් කරන අවස්ථාවේදී තෝරා ගත යුතුය | මධ්‍යම පාසලේ 3 වන වසරේ අප්‍රේල් - ජනවාරි | දූ.ක. 0120-52-1286 |
| අශිනගා ශිෂ්‍යත්ව සංගමය | පෞද්ගලික උසස් පාසල ¥300,000 | අයදුම්පත සැප්තැම්බර් 1 සිට බාගත කළ හැකිය. | දූ.ක. 0120-77-8565 |

# පාසල් ගාස්තු සඳහා මූල්‍ය සහය
# ශිෂ්‍යත්ව ක්‍රමය



පවුලේ අයහපත් තත්ත්වයන් හෝ වෙනත් හේතූන් මත මූල්‍ය අවශ්‍යතා ඇති සිසුන් සඳහා ශිෂ්‍යත්ව හෝ පොලී රහිත ණය ලබා ගත හැකිය. උපාධිය සම්පූර්ණ කිරීමෙන් පසු ණය ආපසු ගෙවිය යුතුය. එයට අවශ්‍ය සුදුසුකම්, නිර්ණායක සහ ආපසු ගෙවීමේ ක්‍රමය පිළිබඳ වැඩිදුර තොරතුරු පහත ලැයිස්තුගත කර ඇති ආයතනවලින් සෘජුවම විමසා දැන ගත හැකිය.

| නම | ණය මුදල | අයදුම් කිරීම | විමසීම් |
|---|---|---|---|
| ඔසාකා ප්‍රාන්ත ශිෂ්‍යත්ව සංගමය | රාජ්‍ය සහ පෞද්ගලික උසස් පාසල<br>සැබෑ උපකාරක ගාස්තු සහ ¥100,000 හෝ ඊට අඩු | මුල් සැප්තැම්බර් - මධ්‍යම පාසලේ 3 වන වසරේ ඔක්තෝබර් මුල<br>උසස් පාසලට ඇතුළත් වීමෙන් පසුව ද හැකි ය | දූ.ක. 06-6357-6272 |
| ජීවන සුබසාධන අරමුදල් | මාසිකව ¥35,000 දක්වා | ඕනෑම අවස්ථාවක | නාගරික සමාජ සුබසාධන සභාව |
| තනි මව් පවුල්, තනි පිය පවුල්, සහ වැන්දඹු සුබසාධන අරමුදල් | ඕනෑම මුක්ත කළ උසස් පාසල් උපකාරක ගාස්තුවක් ණය සඳහා සුදුසුකම් නොලබයි (උපදේශනයෙන් පසුව මුදල තීරණය කරනු ලැබේ.) | ඔබ ඇතුළත් වන්නේ කුමන පාසලට ද යන්න තීරණය කිරීමෙන් පසුව ඕනෑම අවස්ථාවක | ඔබේ නගරයේ හෝ අගනගරයේ සහ වෙනත් ආයතනවල සුබසාධන කාර්යාල |
| රිය අනතුරු සරණ ශිෂ්‍යත්ව සංගමය | ① යෙන් 20,000<br>② යෙන් 30,000<br>③ මාසිකව යෙන් 40,000<br>අයදුම් කරන අවස්ථාවේදී තෝරා ගත යුතුය | අප්‍රේල් - ජනවාරි<br>මධ්‍යම පාසලේ 3 වසර, හෝ<br>අප්‍රේල් - ජනවාරි<br>උසස් පාසලට ඇතුළු වූ පසු | දූ.ක. 0120-52-1286 |
| අශිනගා ශිෂ්‍යත්ව සංගමය | මාසික මුදල:<br>රජයේ උසස් පාසල: ¥30,000<br>පෞද්ගලික උසස් පාසල: ¥30,000 | අයදුම්පත සැප්තැම්බර් 1 සිට බාගත කළ හැකිය. | දූ.ක. 0120-77-8565 |
| චීනයෙන් ආපසු පැමිණෙන්නන්ගේ උසස් පාසල් ශිෂ්‍යත්වය | මාසිකව ¥20,000<br>ආපසු ගෙවීමට අවශ්‍ය නැත | නොවැම්බර් 1 - දෙසැම්බර් 15 මධ්‍යම පාසලේ 3 වන වසරේ | යමසකි තොයොතො සංස්කෘතික පදනම<br>දූ.ක. 072-266-2522 |
| කොරියානු ශිෂ්‍යත්ව සංගමය | මාසිකව ¥10,000<br>ආපසු ගෙවීමට අවශ්‍ය නැත | අප්‍රේල් සිට මැයි දක්වා (අන්තර්ජාලය හරහා අයදුම්පත්) | දූ.ක. 03-3343-5757 |

# ආදායම් මාර්ග අහිමි වීම හේතුවෙන් උපකාරක පන්ති ගාස්තු ගෙවීම සඳහා මූල්‍ය සහය පද්ධතිය

**දෙමව්පියන්ගේ හෝ භාරකරුගේ රැකියා තත්ත්වය, ඔවුන්ගේ අඩු ආදායම් තත්ත්වය හේතුවෙන් උපකාරක පන්ති ගාස්තු ගෙවීමට අපහසු නම්, උපකාරක පන්ති ගාස්තු අඩු කිරීමට හෝ ගෙවීමෙන් නිදහස් කිරීමට හැකි වේ. ඒ සඳහා, ඔබ සපුරාලිය යුතු අවශ්‍යතා පිළිබඳ වැඩි විස්තර දැනගැනීමට ඔබේ පාසල හෝ පහත ආයතන විමසිය යුතු වේ. (ජපන් භාෂාවෙන් පමණකි)**

**■ රජයේ පාසල් සඳහා**

ඔසාකා ප්‍රාන්ත අධ්‍යාපන ආයතන සඳහා මුදල් දෙපාර්තමේන්තුව, රාජ්‍ය ආදායම් දෙපාර්තමේන්තු සමූහය

දුරකථන අංකය: 06-6941-0351 (දිගුව.. 6913)

**■පෞද්ගලික පාසල් සඳහා**


ඔසාකා ප්‍රාන්ත අධ්‍යාපන මණ්ඩලය, පෞද්ගලික පාසල් අංශය, ප්‍රාථමික, කනිෂ්ඨ උසස්, සහ උසස් පාසල් ප්‍රවර්ධන කණ්ඩායම

දුරකථන අංකය: 06-6941-0351 (ස්විච් පුවරු නියෝජිත)

ඔසාකා ප්‍රාන්ත පුරවැසි විමර්ශන මධ්‍යස්ථානය, පිපිත්තො ලයින්

දුරකථන අංකය: 06-6910-8001

# උසස් පාසල සඳහා විකල්ප



**කනිෂ්ඨ උසස් / මධ්‍යම පාසලෙන් උපාධිය ලැබීමෙන් පසු පිවිසීමට ඇති එකම මාර්ගය උසස් පාසල නොවේ. පහත දැක්වෙන්නේ විකල්ප කිහිපයකි.**

■ **උසස් පාසල හැර වෙනත් පාසල්**

**කාර්මික විද්‍යාලය**
ඉංජිනේරු සහ තාක්ෂණික විෂයයන් පිළිබඳ විශේෂඥ පාසල

**විශේෂ පුහුණු පාසල**
රැකියාවේ හෝ එදිනෙදා ජීවිතයේ අත්‍යවශ්‍ය දේ ගැන ඉගෙන ගැනීමේ පාසල

**වෘත්තීය පුහුණු පාසල**
වැඩ කිරීම සඳහා කුසලතා සහ ශිල්පීය ක්‍රම ඉගෙන ගැනීමේ පාසල

<u>සෑම පාසලකම විශේෂ සහ විවිධ විෂයයන් උගන්වයි. වැඩිදුර තොරතුරු සඳහා ඔබේ පන්ති භාර ගුරුවරයාගෙන් විමසන්න.</u>

■ ගෘහ පාලනය, පවුලේ ව්‍යාපාර



■ රැකියා සොයා ගැනීම



මම රැකියාවක් සොයා ගන්නේ කෙසේද?

⇒ ප්‍රධාන ක්‍රම දෙකක් තිබේ:

① හෙලෝ වර්ක් කාර්යාලයක් හරහා රැකියා ඇබෑර්තු සඳහා අයදුම් කිරීම.

② පෞද්ගලික හෝ පවුල් සබඳතා හරහා රැකියාවක් සොයා ගැනීම.

හෙලෝ වර්ක් යනු වැඩ කිරීමට කැමති අයට රැකියා සොයා ගැනීමට උපකාර කිරීම සඳහා ඇති මහජන සුභසාධන සංවිධානයකි.

ඇතැම් හෙලෝ වර්ක් කාර්යාල චීන, ඉංග්‍රීසි, පෘතුගීසි, ස්පාඤ්ඤ, වියට්නාම,යුක්රේන,නේපාල භාෂාවලින් උපදේශන ලබා දේ.

# උපකාරක සංවිධාන ලැයිස්තුව

**ඔබට දුරකථනයෙන් හෝ විද්‍යුත් තැපෑලෙන් උසස් පාසල හෝ වෙනත් විකල්ප මාර්ග පිළිබඳ උපදෙස් ලබා ගත හැක.**

| සංවිධානයේ නම | දුරකථන අංකය | භාෂා මාධ්‍යය |
|---|---|---|
| ඔසාකා ප්‍රාන්ත අධ්‍යාපන නියෝජිතායතනය, මහ නගර සහා නාගරික අධ්‍යාපන කාර්යාලය, ප්‍රාථමික සහ කනිෂ්ඨ උසස් පාසල් අංශය, වෘත්තීය සහය සඳහා කණ්ඩායම | දු.ක.<br>06-6941-0351<br>(දිගුව: 5484) | ජපන් |
| ඔසාකා නගර අධ්‍යාපන මණ්ඩලය | දු.ක.<br>06-6208-8128 | ජපන් |
| සකයි නගර අධ්‍යාපන මණ්ඩලය | දු.ක.<br>072-228-7436 | ජපන් |
| ජපානයේ විදේශිකයන් සඳහා ඔසාකා ප්‍රාන්ත අධ්‍යාපන කවුන්සිලය | ෆැක්ස්:<br>050-3383-2683<br>ඊමේල්<br>fugaikyo@nifty.com | ජපන් |
| විදේශිකයන් සඳහා ඔසාකා නගර අධ්‍යාපන කවුන්සිලය | දු.ක.<br>070-1796-0050 | ජපන් |

2024 සැප්තැම්බර් මාසයේදී ප්‍රකාශනයට පත් කරන ලදී

◆ **සම්පාදනය කර ප්‍රකාශනය කරන ලද්දේ** ◆
ඔසාකා ප්‍රාන්ත අධ්‍යාපන නියෝජිතායතනය, මහ නගර සහා නාගරික අධ්‍යාපන කාර්යාලය, ප්‍රාථමික සහ කනිෂ්ඨ උසස් පාසල් අංශය, වෘත්තීය සහය සඳහා කණ්ඩායම
දු.ක. 06-6941-0351 (දිගුව. 5484) FAX 06-6944-3826
විද්‍යුත් තැපැල shichosonkyoiku@sbox.pref.osaka.lg.jp
https://www.pref.osaka.lg.jp/shochugakko/
※ වාණිජමය භාවිතය සඳහා හැර නැවත නිෂ්පාදනයට අවසර ඇත.
ප්‍රතිනිෂ්පාදනය කරන විට, මුල් මූලාශ්‍රය දක්වන්න.